# අක්කරෙයිපත්තු ප්‍රාදේශිය සභාව
# අම්පාර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අක්කරේපත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂන විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 8,250 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) විදුලි ගාස්තු, ජල ගාස්තු හා දුරකථන ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු එකතුව රු. 16,500 ක මුදල සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) බදුකරුවන්ගෙන් අයකළ මස්කඩ බදු ආදායම රු. 583,000 ක මුදල ආදායම් ගිණුමට මාරු නොකර තැන්පත් ගිණුමේ සටහන් කර තිබුණි.

1.3.3 ලැබියයුතු ගිණුම්

-------------------

2010 වර්ෂයේදී ස්ථාන මාරුවූ නිලධාරින් තුන් දෙනෙකුගේ ණය ශේෂය වන රු. 4,500 මාරුවීම් ලැබූ ආයතනයෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

-----------------------------------------------------------

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| 1988 වර්ෂයේ ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | |
| i. | පරිච්ඡේදය 1 වගන්තිය 5(XII) | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත් අත්සන් කිරීම යන රාජකාරි නිලධාරින් තිදෙනෙකුට පවරා තිබුණද ඔවුන්ගෙන් ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |
| ii. | පරිච්ඡේදය X වගන්තිය 191 | සමාලෝචිත වර්ෂයේදී සභා රැස්වීම් දහතුනක් පවත්වා තිබුණි එම රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| iii. | පරිච්ඡේදය X වගන්තිය 193 | සමාලෝචිත වර්ෂයේ ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය ලේඛනය සමග සසඳා විචලනයන් සඳහා හේතු සමග ප්‍රකාශනයක් සකස්කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 472,393 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 4,427,133 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,954,741 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 දී දෙසැම්බර් 31 දින දක්වා ලැබියයුතු රු. 500,000 ක උසාවි දඩ මුදල නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගත යුතුව තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබීය යුතු මුද්දර ගාස්තු රු. 4,100,000 ක මුදල රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් ලබා ගත යුතුව තිබුණි.

2.2.2 වෙනත් ආදායම්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 වර්ෂයේ අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ හේතුවෙන් සභා බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන් විසින් ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම් සඳහා ස්ථාපිතකරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු 04 ක් වෙනුවෙන් සහ දුරකථන ආයතනයන් විසින් ස්ථාපිත කරන ලද විදුලි සංදේශ කුළුනු 02 ක් සම්බන්ධයෙන්ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවියයුතු රු. 60,000 පමණ ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ආ) 2012 සිට 2013 වර්ෂය සඳහාවූ කාලපරිච්ඡෙදයට අයත් මස්කඩ බදු වන රු. 21,301 ක මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුනි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකරගත් එකතුකල අගය මත බදු රු. 40,716 ක මුදල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වෙතට ප්‍රේක්ෂණය කිරීමට විගණන දිනය වන 2014 ජූනි 15 දක්වා කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
-------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි දක්වා ඇතත් සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම